# විභක්ති

## 01 ප්‍රථමා විභක්ති

ඕනෑ ම වාක්‍යයක උක්ත කර්තෘ ප්‍රථමා විභක්ති අර්ථ ගනී.

උදා: ශිෂ්‍යයෝ ගුරුවරුන් නමදිති.

පහත සඳහන් වාක්‍යවල ප්‍රථමා විභක්තිය යටින් ඉරක් අඳින්න.

1. අම්මා දරුවන් නළවයි.
2. ගුරුතුමා පාඩම පැහැදිලි කරයි.
3. ගොවියෝ රටට සහල් සපයති.
4. ගායක ගායිකාවෝ රසිකයන් කුල්මත් කළහ.
5. කවියා කවියක් ලියන්නේ ය.

වාක්‍යයක කර්ම පදය උක්ත වන අවස්ථා ද ඇත.

උදා: පාලකයන් විසින් සේවකයෝ පසසනු ලබති.

පහත සඳහන් වාක්‍යවල ප්‍රථමා විභක්තිය යටින් ඉරක් අඳින්න.

1. වැද්දන් විසින් සතුන් මරනු ලබති.
2. නිමල් විසින් පුවත්පත බලනු ලබයි.
3. තරුණයන් විසින් ගම්වැසියෝ ආරක්ෂා කෙරෙති.
4. දරුවන් විසින් දෙමවුපියෝ රැකෙති.
5. විදුහල්පතිතුමා විසින් දරුවෝ දඬුවමට ලක්වනු ලබති.

## 02 කර්ම විභක්ති

වාක්‍යයක අනුක්ත කර්මය කර්ම විභක්ති අර්ථ ගනී.

උදා: සිංහයෝ මුවන් ලුහු බඳිති.

පහත සඳහන් කර්ම විභක්ති පද යොදා වාක්‍ය සාදන්න.

1. ගොවියන්
2. ළමයින්
3. සිටුවරුන්
4. වෛද්‍යවරුන්
5. ගායකයින්

- මෙන්, සේ, වැනි, එව්, ලෙස, මුත්, විලස, පාසා, වෙත, කරා යනා දී නිපාත පද සමඟ යෙදෙන්නේ ද කර්ම විභක්ති පදයයි.

  උදා: මම දෙවඟනක මෙන් සැරසුණෙමි.

ඉහත සඳහන් නිපාත පද උපයුක්ත කරගනිමින් කර්ම විභක්ති අර්ථ ගැන්වූ වාක්‍ය 05ක් සාදන්න.

## 03 කර්තෘ විභක්ති

අනුක්ත කර්තෘ, කර්තෘ විභක්ති අර්ථ ගනී.

උදා: රජවරුන් විසින් දොරටු පාලකයෝ පරීක්ෂාවට ලක් කරනු ලබති.

හෙදියන් විසින්, පූජකවරුන් විසින්, පාරිභෝගකයා විසින්, කෙල්ල විසින්, ඔටුවන් විසින්

ඉහත සඳහන් කර්තෘ විභක්ති අර්ථ ගැන්වූ වචන යොදා වාක්‍ය 05ක් සාදන්න.